# වී මිලදී ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තියේ ක්ෂේත්‍ර ගැටලු
## (දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

එච්.ඒ.එස්.එස්. හෙට්ටිආරච්චි[1] ඒ.ඒ.පී. දිසානායක[2]
ඩී.එම්.එම්. නිරෝෂන්[3] එම්.කේ. නදීකා දමයන්ති[4]

**සංක්ෂේපය**

කෘෂි නිෂ්පාදන ක්‍රියාවලියේ යම් යම් කටයුතුවල නිරතව සිටිනගොවීන්, නිෂ්පාදන මිලට ගැනීම සහ අමුද්‍රව්‍ය අලෙවි කටයුතුවල නිරත වන පෞද්ගලික අංශය සේම රාජ්‍ය අංශයේ නිලධාරීනුත්, සහල් සැකසීමේ කර්මාන්තයෙහි නිරතව සිටින පෞද්ගලික අංශයත්විවිධාකාරයේ ගැටලුවලට මුහුණ දෙන බව එදිනෙදා සාකච්ඡාවන්හිදී මෙන්ම මාධ්‍ය තුළින්ද වාර්තා වේ. මෙම ගැටලු විසඳීමේ අරමුණින් රජය විසින් වරින් වර යම් යම් පියවර ගෙන ඇති අතර වී මිලට ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය මේ ආකාරයට ගොවි ගැටලු විසඳීමේ අරමුණින් රජය විසින් හඳුන්වා දෙන ලද්දකි. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ වී මිළදී ගැනීමේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීමේදී ගැටලු උද්ගත කරනු ලබන්නේද එසේනම් ඒ මොනවාද යන්න හඳුනා ගැනීමයි. එහිදී වී ගොවිතැන් විශාල වශයෙන් සිදු කරන දිස්ත්‍රික්ක අතුරින් පොළොන්නරු දිස්ත්‍රික්කයේ දිඹුලාගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ 231 සඳගලතැන්න ග්‍රාම නිලධාරී වසම තෝරා ගැණින. අධ්‍යයන නියැදියට අහඹු ලෙස තෝරා ගත් ගොවීන් 50ක් ඇතුළත් වූ අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා මඟින් ප්‍රාථමික දත්ත සහ තොරතුරු සපයා ගැණින. එමෙන්ම ලබා ගත් ඇතැම් තොරතුරු නිරීක්ෂණය මඟින් මෙන්ම මූලික තොරතුරු සපයන්නන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා තුළින් තහවුරු කර ගැණින. නියැදියේ ගොවීන්ගෙන් 90%ක් සම්බා වී වගා කර ඇති අතර පසුගිය යල කන්නයේ අස්වැන්න වශයෙන් ගොවීන්ගෙන් 23%ක් කි.ග්‍රෑ. 1000-1500 අතර ද, 33% කි.ග්‍රෑ 1601-2000 අතර ද 44% කි.ග්‍රෑ. 2001-3000 අතර ද ලබාගෙන ඇත. වී අලෙවියේදී ගොවීන්ගෙන් 20%ක් රාජ්‍ය අංශයට පමණක් ද 67%ක් පෞද්ගලික අංශයට පමණක් ද 13%ක් අංශ දෙකටම ද වී අලෙවි කර ඇත. රාජ්‍ය අංශයේ ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොවීම නිසා මිලට නොගැනීම (26%), වී අලෙවි කිරීමට විශාල කාලයක් ගතවීම (25%), රජය බලාපොරොත්තු වන ප්‍රමිතියට විකිණීමට නොහැකිවීම, සීමිත වී ප්‍රමාණයක් පමණක් මිලට ගැනීම (4%), ප්‍රවාහන ගැටලු (2%) ආදිය රාජ්‍ය අංශයට වී අලෙවියට තිබූ බාධා ලෙස අනාවරණය විය. මෙයට අමතරව පෞද්ගලික අංශය විසින් ගොවීන්ගෙන් වී මිලට ගෙන රාජ්‍ය අංශයට අලෙවි කිරීම ද සිදුවූ බව (7%) අනාවරණය විය.

**මුඛ්‍ය පද ඃ** *වී අලෙවි ප්‍රතිපත්තිය, දිඹුලාගල, ගොවීන්, අලෙවි ගැටලු*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[4] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk